# බුදු සසුනේ අඳුරු යුගය පිළිබඳ හැඳින්වීමක්...

අජිත් තල්වත්ත

ශ්‍රී ලංකාවේ බුදු සසුනේ ව්‍යාප්තිය ආරම්භ වන්නේ මහින්දාගමනය තුළිනි. ඊට පෙර මෙරට සම්බුද්ධ සසුන හා සම්බන්ධ සිද්ධීන් කිහිපයක් ඇත. ඉන් වඩාත් ප්‍රමුඛ වන්නේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ වැඩමවීම හා සම්බන්ධ වූ වෘත්තාන්තයයි. බුදු සමය ජනතාව අතර ප්‍රචලිතව පැවතියත් ප්‍රකටව ආරම්භ වන්නේ ක්‍රි : පූ: 3 වන සිදුවූ මහින්දාගමනයත් සමඟය. ඒ මගින් මෙරට මුල්බැසගත් බුදු දහමත්, බුදු සසුනත්, සමාජය තුළ ඇති මහත් පරිවර්තනයක් ඇති කිරිමට සමත් විය[1]. එතෙක් මෙරටෙහි පැවති විවිධ ආගමික ඇදහිලි පමණක් නොව ජන ජීවිතය අභිබවා නව සංස්කෘතියක් උදාවූයේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි. සිංහල සමාජ සංවිධානය, භික්ෂු ශාසනය හා රාජ්‍යත්වය යන ත්‍රිවිධ අංශ මනාව සකස් වී එකිනෙකින් වෙන් කළ නොහැකි සේ බැඳෙමින් අන්‍යෝන්‍ය වශයෙන් ආරක්ෂා වී වර්ධනය විය. පූර්ණ ස්වාධීන ජාතියකට අවශ්‍ය ආර්ථික සැලැස්ම හා ශිල්ප ශාස්ත්‍ර, ගෘහ නිර්මාණ ශිල්ප, කලා ශිල්ප, සහ සාහිත්‍යකරණය මෙන්ම බුදු දහමින් ප්‍රභාවිත ආචාර ධර්ම පද්ධතියක් ද මිහිඳු මා හිමියෝ ශ්‍රී ලාංකිකයන්ට ලබා දුන්නහ. රාජ්‍ය පාලකයා ප්‍රමුඛ ප්‍රභූන් බුදු දහම වැළඳ ගැනීමෙන් ඔවුන්ගෙන් ලැබුණු අනුග්‍රාහයත් නිසා රට පුරා බුදු දහම ව්‍යාප්ත වී ඉදි වූ බෞද්ධ විහාරාරාමත් ඒවායේ වැඩවිසූ භික්ෂූන් වහන්සේලාගේ ශාසනික මෙහෙවරත් නිසා සිංහලයාගේ ජීවන රටාවෙන් වෙන් කළ නොහැකි අන්දමින් ස්ථාපිත විය. ශ්‍රී මහා බෝධිය, දළදාව, පාත්‍රා ධාතුව මෙරට සිංහ ජන සමාජය හා සමීපව පැවතුණි. දිගින් දිගට ලැබුණු රාජකීය අනුග්‍රහය යටතේ ශතවර්ෂ ගණනාවක් රක්ෂිතව පෝෂණය වූ බුදු සසුන ලංකා ඉතිහාසයේ ජීවනාලිය බවට පත්විය[2]. භික්ෂුවත්, භික්ෂුවගේ ආධිපත්‍යයත් රජුගේ අණසක පවා අභිබවන්නට සමත් වූ බව පෙනේ. බුද්ධාගම සිංහල දේශයෙත් සිංහල ජාතියගේත් උරුමය ලෙසත් ආගම ලෙසිනුතත් ස්ථිර විය.

ථෙරවාදී බුදු දහම සම්බන්ධ වූ අතිශය වැදගත් කාල පරිච්ඡේද උදාවන්නේ දිවයින ප්‍රථම වතාවට එක්සත් කරන ලද දුට්ඨගාමිණී (ක්‍රි.පූ.101 - 137) රජුගේ කාල පරිච්ඡේදය තුළයි[3]. එතුමන් විසින් රුවන්වැලි මහා සෑය යනාදි චෛත්‍යය ඉදිකරමින් බුදු දහමේ අභිවෘද්ධියට

---

01. ජයවීර ඒ.එම්.එස්,රාජ්‍ය සහ ආගම, ඇම්පර් ප්‍රකාශන,කැලණිය, 1990. 1-20
02. එම,පිටු 1 - 20 .
03. සිරිවීර,ඉන්ද්‍රකීර්ති, රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි, දයාවංශ ජයකොඩි සමාගම, කොළඹ,පිටු 336.

ක්‍රියාකර තිබේ. මහාවිහාරය කේන්ද්‍රකරගත් ථෙරවාදී බුදු දහමේ බැබළීම වලගම්බා යුගය තෙක්ම ඍජුවම ගමන් කරයි. විහාරරාම උදෙසා රජුන් හා ප්‍රභූන් විසින් ඉඩකඩම් පූජා කිරීමේ හේතුවෙන් විහාරාරාම ආශ්‍රිත දේපොළ වර්ධනය විය. ඒ සමඟම ඉන්දියාවේ මහායාන මත ප්‍රචලිතවීමේ බලපෑම තුළින් වැඩිකල් නොගොස් ශාසනය භේද භින්න විය. වලගම්බා රජුගේ කාලයේදී හටගත් බැමිණිටියා සාය නිසා ජීවත්වීමට ඉන්දියාවට ගිය ඇතැම් භික්ෂූන් වහන්සේලා ආපසු ලංකාවට පැමිණි පසු වඩා වැදගත් වන්නේ පිළිවෙත් පිරිම ද, ධර්ම දේශනය ද යන වතවාදය පැන නැගුණු අතර ධර්ම දේශනය වඩා වැදගත් යයි සැලකූ ධර්මරුචි නිකායක් ද පිළිවෙත් පිරිම 01 වැදගත් යැයි සිතූ පාංශකූලික නිකායක් බිහිවිය[4]. මෙම දෙකඩවීමේ වැදගත් ප්‍රතිඵලය නම් ත්‍රිපිටකය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය මතුවී මාතලේ අලුවිහාරයේදී ග්‍රන්ථාරූඪ කරවන ලදී.

රජු වනගතව සිටින විට ආරක්ෂාව සැපයූ කුපික්කලතිස්ස තෙරුන් වහන්සේට අභයගිරිය පූජා කිරීමෙන්, එම තෙරුන්වහන්සේ ''කුලසංසග්ග''නම් වරදට මහාවිහාරයෙන් නෙරපීමටත්, උන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය තිස්ස තෙරනමක් එයින් කෝපයට පත් විශාල භික්ෂූන් පිරිසක් සමග අභයගිරියට යාමත් සමග මෙරට ඉතිහාසයේ ප්‍රථම වතාවට සංඝ භේදය හටගත්තේය[5]. මහා විහාර , අභයගිරි වැඩි භික්ෂූන් රජු තමන්ට අවනතකොටගෙන තම පාර්ශවය වඩාත් ඉදිරියෙන් තබනු පිණිස ක්‍රියාකරද්දී ඒ ඒ පාර්ශවයන්ට භයානක ලෙස හානි පැමිණි විම නිසා සසුනට මහත් හානියක් ද සිදු විය. ක්‍රමිකව වර්ධනය වූ වෛතුල්‍යවාදය මහා විහාරිකයන් විසින් මිත්‍යවාදයක් ලෙස වෝහාරිකතිස්ස රජුට (ක්‍රි : ව :209 - 231) දැන්වීමෙන් පසු රජු අධර්මවාදින් මර්දනය කර ශාසනයයෙහි ප්‍රතිසංවිධානයක් සිදුකරන ලදි. ලංකාව හැර ගිය එතෙක් අභයගිරියෙහි විසූ වෛතුල්‍යවාදය ගත් භික්ෂූන් කාවේරි පටුනෙහි වාසය කළහ. මෙම සිදුවීමෙන් අනතුරුව උස්සිලියා තිස්ස තෙරුන් ද භික්ෂූන් වහන්සේලා සමඟ දක්ඛිණගිරි විහාරයේ වාසයට ගියහ. ඔවුන් සාගලික නිකාය යනුවෙන් හඳුන්වන ලදි.

ගෝඨාභය (ක්‍රි: ව: 249 - 262) රජුගේ කාලයේදී යළිත් සංඝ සංශෝධනයක් සිදු විය. ගෝඨාභය රජු අභයගිරි විහාරයෙහි විසූ වෛතුල්‍යවාදි භික්ෂූන් වහන්සේලා සැට නමක් ශාසනයෙන් ඉවත්කොට රටින් පිටුවහල් කරන ලද බව මහාවංශයෙහි සඳහන් වේ. පළිගැනීමේ චේතනාවෙන් සිටි සංඝමිත්‍ර භික්ෂුව රජුගේ පුතුන් දෙදෙනාට ශිල්ප ඉගැන්වීමට හැකි විය. එහෙත් දෙටුතිස් (ක්‍රි:ව:263-273) ඔහුට අවනත නොවීය. පසුව රජ පැමිණි මහසෙන් (ක්‍රි:ව:274-301)පොළඹවා මහා විහාරයෙන් පළිගැනිම සඳහා මහාවිහාරිකයන්ට සිවුපසය දීම වලක්වා, විහාරය පාලුවන්නට හැර, ටික කලකින් මහාවිහාරයේ ගොඩනැගිලි විනාශකර උඳු වපුරා තිබේ. මෙම සිදුවිමට එරෙහි ප්‍රබල උද්ඝෝෂණයක් ඇති විය. මහා විහාර සිමාවෙහි ජේතවන විහාරය ගොඩනගා දකුණු විහාර වාසීව වැඩ සිටි සාගලික නිකායික වු තිස්ස නම්

04. එම,පිටු ,336.

05. රාහුල,වල්පොළ, භික්ෂුවගේ උරුමය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ,කොළඹ,1992 පිටු,32 .

තෙර නමකට පිදීමත් සමග නව නිකායක් ඇතිවූ බව පෙනේ.

සිරිමේඝවර්ණ (ක්‍රි:ව:301-328)රජුගේ කාලයේදී කාලිංග දේශයෙන් ශ්‍රී ලංකාවට දන්ත ධාතුව වැඩම නරවන ලදී. මෙයින් ටික කලකට පසු අභයගිරි විහාරයේ ප්‍රමුඛත්වයෙන් දළදා පෙරහැර අරම්භ විය. ධාතුසේන, මුගලන් ආදි රජුන් දවස සසුනට නොයෙක් සංග්‍රහයක් ලැබුණු අතර සිලාකාල රජු දවස දඹදිව ගිය පූර්ණ නම් වෙළෙන්දෙක් ධර්මධාතු නම් ග්‍රන්ථයක් රැගෙන ආවේය[6]. එය උතුම් වස්තුවක් ලෙස ජේතවන නිකායකයින් විසින් සලකන ලදි. දෙවැනි සේන (ක්‍රි:ව:853-887) රජු දවස නීලපට දර්ශනය නම් මිත්‍යා මතවාදයක් ලක්දිවට පැමිණියේය. නමුත් රජුගේ මැදිහත්විමෙන් එය මර්දනය කරන ලදි. විවිධ මතවාද හට ගැනීමත් සමග භික්ෂු ශාසනයේ නොයෙක් වියවුල් හටගත් අතර රජු ඉදිරිපත් විමෙන් ඒවා සංසිඳවන ලදී. කෙසේ වුවත් විහාරාශ්‍රිත ලෞකික දේපල වර්ධනයත් සමග පිරිහි ගිය මතවාද ප්‍රචාරය වීමේ අවසාන ප්‍රතිඵලය වුයේ අනුරාධපුර රාජධානිය බිඳ වැටෙන්නට ආසන්න වන විට ශාසනය ද පිරිහිමට පත්වීමයි.

ක්‍රි:ව:1017-1070 කාල පරිච්ඡේදයේ පැවති චෝළ පාලනය තුළින් හින්දු සභ්‍යත්වය ව්‍යාප්ත විමත් සමග බෞද්ධාගම පරිහානියට පත් විය. බුද්ධ ශාසනය යළි ප්‍රබෝධමත් කිරිම සඳහා මහා විජයබාහු රජතුමා(ක්‍රි:ව:1070-1110) නැවතත් විදේශයෙන් උපසම්පදාව පිහිටවූ බව නිකාය සංග්‍රහයේ සඳහන් වේ. පොළොන්නරුවෙහි ඒ ඒ තැන්හි අතිශයින් මනහර විහාරාරාම කරවා තුන් නිකායෙහිම භික්ෂුන් එහි වැස්විය[7]. එතුමා විසින් ඇති කළ ශාසනික පිබිදීම ඇති වු සිවිල් අර්බුදකාරි යුගයේදි යළි නොදියුණු තත්ත්වයට පත්විය.

ලංකා ශාසන ඉතිහාසයෙ හි දුටුගැමුණු රජතුමාට හිමි ස්ථානයට නො දෙවැනි තැනක් පොළොන්නරුවෙහි රජ කළ මහා පරාක්‍රමබාහු (ක්‍රි:ව: 1153-1180) රජුට හිමිවෙයි[8]. පරාක්‍රමබාහු යුගය වනවිට මහා විහාරය , අභයගිරිය, ජේතවන නිකායන් සමගි කිරිමේ කාර්යෙහි රජතුමා නිරත විය. මෙම සංඝ සංශෝධනය දිඹුලාගල මහා කස්සප තෙරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකර තිබේ. අවසානයේ දී තුන් නිකායයන් සමගි කරවන ලද රජු පොදු සංඝ සමාජයෙහි භේද වැලැක්විය හැකි විනය නීතිමාලාවක් සකසා එම කතිකාවත පොළොන්නරු ගල් විහාරයේ කොටවා තැබීය[9]. රජරට, මායා රට සහා රුහුණු රට යන ත්‍රි ත්‍රිසිංහලය පුරාම වෙහෙර විහාර ගොඩනගමින් බෞද්ධාගමේ පුනර්ජිවනය ඇති කිරීමට අවශ්‍ය පසුබිම මෙතුමා විසින් සැලසුවේය.

මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ඇති කරන ලද ශාසනික ප්‍රබෝධය පරිහානි ...ත්ථයකට මුහුණ පෑවේය. නිශ්ශංකමල්ල රජතුමා (ක්‍රි: ව: 1186-1196) සංඝ ශෝධනයක් කළ ...ව සඳහන් වීමෙන් අවබෝධ වන්නේ නැවත සසුන පිරිහුන බවයි. ප්‍රධාන වශයෙන් ...දේශපාලන අවස්ථාවරත්වය තුළින් මතු වු ආර්ථික අවිනිශ්චිතතාවයත්, සමාජීය

06. මහාවංශය පරි, 40. 37 - 39 ගාථා
07. ධර්මකීර්ති,නිවන්දම,ශාසනිකඉතිහාසය,බෞද්ධසංස්කෘතිකමධ්‍යස්ථානය,දෙහිවල,1996,පිටු 105.
08. එම පිටු 107
09. රජරට ශිෂ්ඨාචාරය සහ නිරිතදිග රාජධානි ,එම, පිටු, 343.

ව්‍යාකූලත්වයත්, බු ද්‍රුසමය පිරිහිමට හේතු වූ බව දැක්විය හැකිය. රාජකීය අනුග්‍රහය නිසි පරිදි මහා සංඝයාට නොලැබීමත්, දාන වස්තු නිසි පරිදි ප්‍රදානය නොකිරීමත්, බෞද්ධ පූජස්ථාන පාළුවට යෑමට ඉඩ හැරීමත් නිසා මෙසේ බුද්‍රුසමය පිරිහෙන්නට විය.මීටත් වඩා බරපතල ගැටළුව වූයේ ඇතැම් භික්ෂූන් වහන්සේලා දුශ්ශීල වී මහණදම් පුරනවා වෙනුවට අප්‍රතිපත්ති, දුෂ්ප්‍රතිපත්ති වල නියැලීමට පටන් ගැනීමයි[10].

ක්‍රිඃවඃ1215 දී කාලිංග මාඝගේ ආක්‍රමණයෙන් පසු දිවයිනේ බෞද්ධ ශාසනයට උදා වූයේ මහත් අඳුරු දසාවකි. මාඝ විසින් ගෙන ගිය පාලනය වනාහි පෘතුගීසින් පැමිණීම දක්වා ලංකා බුද්ධ ශාසනය ඉතා බිහිසුණු කාලපරිච්ඡේදයකි[11]. චූලවංශයේ මාඝ පාලනය මෙසේ දක්වා ඇත."මාඝ රජු හා සේනාව පිළිම ගෙවල් බිඳලූහ. බොහෝ චෛත්‍ය වැනසූහ. විහාරවල ලැගුම් ගත්හ. උපාසකවරුන්ට පහර දුන්හ. ප්‍රසිද්ධ ප්‍රශස්ථ බොහෝ ප්‍රස්තකයන් රැහැනින් ගලවා තැන තැන විසුරුවාලූහ. සැදැහැවත් පෙර රජවරුන්ගේ කීර්ති ශරීරයන් බඳු රුවන්වැලි ආදී මහත් උදාර දාගැබ් ඇද දමා, විනාශකොට ඒ දාගැබ් වල පිවිතය බඳු බොහෝ ශාරීරික ධාතු, අහෝ අතුරුදහන් කරවූහ. මාඝ තෙමේ මහා ජනයා මිසදිටු ගැන්විය. විහාර පිරිවෙණ සහ බොහෝ ආයතනයන් යෝධයන්ට වාසස්ථාන කොට පවරා දුන්හ. බුදුන්, දහම්, සඟුන් සතු ධනය පැහැරගත්තේය"[12]. මෙමගින් අවබෝධවන්නේ මාඝ පාලන සමයේ නොසිතූ ආකාරයෙන් බුදුදහමේ පරිහානිය ලගා වූ බවයි.

මාඝ පාලන සමයේ ඇතිවූ ශාසනික විලෝපනි තත්ත්වය තුළ බුද්ධ ශාසනයේ, බෞද්ධ පොතපතේත් ආරක්ෂාව තහවුරු කිරිම මලය හා රෝහණ දේශයේ වැසියන්ට පැවරූහ. ඇතැම් භික්ෂූන් වහන්සේලා පැවති පසුබිමට මුහුණදීමට නොහැකිව රට අතහැර විදේශ ගත වූහ. දළදාව හා පාත්‍රා ධාතුව ආරක්ෂා කිරිමේ අරමුණින් කොත්මලේ සඟවා තැබීමට භික්ෂූන් වහන්සේලා ක්‍රියා කළහ. මාඝ ආක්‍රමණයෙන් කම්පනයට පත් සංඝයා ප්‍රථම වරට තම පාරම්පරික වනසෙනසුන මුළුමනින්ම හැර දමා එක් කොටසක් ශුභ සේනාධිකාරීන් වෙතට ද අනෙක් කණ්ඩායම දඹදෙණියේ විජයබාහු වෙතට ද ගියහ[13]. යාපහුවට ගිය භික්ෂූන් වහන්සේලා වළස්ගලට ද දඹදෙණියට පැමිණි භික්ෂූන් වහන්සේලා දඹදෙණි විජයසුන්දරාරාමයට ද එකතු වූ බව පෙනේ.

දඹදෙණිය ස්වකීය අගනගරය වශයෙන් තෝරාගෙන බලයට පත් සසස විජයබාහු (ක්‍රිඃවඃ1246-1250) රාජ්‍ය සමය තුළින් බුද්ධ ශාසනයේ නව කාල පරිච්ඡේදයක් උදාවිය. විජයබාහු රජතුමා මුලින්ම කළ කාර්ය වූයේ දේශය අතහැර ගිය භික්ෂූන් වහන්සේලා මෙරට වැඩම කරවීමට ක්‍රියා කිරිමයි. කොත්මලේ සඟවා තිබූ දළදාව සහ පාත්‍රා ධාතුව දඹදෙණියට වඩමවාගෙන, බෙලිගල පර්වත මුදුනේ අලංකාර මන්දිරයක් තනා එහි හිඳුවා එහි භාරකාරත්වය භික්ෂූන් වහන්සේලාට පැවරුවේය. දඹදෙණි රාජධානියේ රජුගේ නමින් කරවූ

10. බස්නායක,එච්.ටී.ශ්‍රී ලංකා ශිෂ්ටාචාරය 11, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,දෙහිවල,2002. පිටු, 119.
11. විශ්ව විද්‍යාල ලංකා ඉතිහාසය 11, සංස්. චන්ද්‍රරාජය,හෙම්, පොළොන්නරු යුගයේ සභ්‍යත්වය ආගම, සාහිත්‍ය කලාව, පරණවිතාරණ, එස්. විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය,1972, පිටු 535 - 547.
12. එම,පිටු 535 - 547.
13. රෝහණදීර,මැන්දිස්,සංස්, අස්ගිරි තල්පත,විද්‍යෝදයවිශ්වවිද්‍යාල, නුගේගොඩ,1969,පිටු, 5.

විජයසුන්දරාරාමය භික්ෂූන් වහන්සේගේ ප්‍රධාන මූලස්ථානය බවට පත් වූ බව පෙනේ. සසුනේ අභිවෘද්ධියට රජතුමාගෙන් ඉටු වූ සුවිශේෂී කාර්යන් කිහිපයක් සිදු කරන ලදි. එකී සාසනික දියුණුවට එවකට වැඩ සිටි ග්‍රාම වාසි නිකායට අයත් සංඝරක්ඛිත මාහිමි සහ මේධංකර මහ ස්ථවිරත් ආරණ්‍යවාසි නිකායට අයත් දිඹුලාගල මේධංකර මහ තෙරණුවොත් උපකාර වූහ. විජයසුන්දරාරාමයට රැස් වූ භික්ෂූන් වහන්සේලා ඔවුන් අතර පැවති විවිධ මතවාද හඳුනාගෙන සැමට පිළිගත හැකි පොදු කතිකාවතත් පිළියෙල කළහ. පොළොන්නරුවේදි බුදු සසුනේ අභිවෘද්ධියට කතිකාවතත් සිදුකර එපමණ කාලයක් ගතවීමට ප්‍රථම නැවත එවෙනි දෙයක් සිදුකිරීමෙන් පසක් වන්නේ සඝ සසුනේ පිරිහිම විශාල වශයෙන් පැවති බවයි. ඒ වන විට පරිහානියට ගොස් තිබූ උපසම්පදාව නගා සිටු වීමට එතුමා අනුග්‍රහය දක්වා තිබේ. රාජධානියෙන් පරිබාහිර වූ ප්‍රදේශ කේන්ද්‍රගතව ශාසනානුග්‍රහය දක්වා තිබේ. වත්තල ප්‍රදේශයෙත් රජුගේ නමින් විහාරයක් කරවූ අතර විනාශයට පත් කැලණි විහාරය, අත්තනගලු විහාරය යනාදි ස්ථාන ප්‍රතිසංස්කරණය කළේය.

නිරිතදිග රාජධානි සමයේ පරිහානියට පත් බුදුසසුනේ නව කාල පරිච්ඡේදයක් දෙවන පරාක්‍රමබාහු (ක්‍රි:ව:1236-1270) රාජ්‍ය සමයේදී උදා වේ. පූජාවලයේ සඳහන් තොරතුරු වලට අනුව තුන්වන වන විජයබාහු ස්වකීය පුතුට මහා සංඝයාද, දළදාව, පාත්‍රාධාතුව සහ රටවැසියන් පවරා දී ඇත[14]. මෙම සිද්ධියෙන් අවබෝධ වන්නේ දෙවන පරාක්‍රමබාහුට රටේ පාලනය සාර්ථකව ගෙනයාම සඳහා අවශ්‍ය පදනම විජය රජු තුළින් සැකසූ බවයි. ඒ වන විට බෙලිගල වැඩ විසූ දළදාව සහ පාත්‍රා ධාතුව දඹදෙණියට වැඩමවා අලංකාර දළදා මැඳුරක් ඉදිකර තැන්පත් කරන ලදී. පූජාවලියේ සඳහන් වන පරිදි "තමාට පර සතුරන් නසා ශාසනයට වැඩක් කළ හැකි වේ නම් දළදා වහන්සේ කිසියම් ප්‍රාතිහාර්යයක් දක්වා වදාරණු මැනවැයි සත්‍යක්‍රියා කිරීමෙන් පසුව, දළදා වහන්සේ අහසට පැන නැගී ජීවමාන බුද්ධ රූපයෙන් පෙනී සිට මහජනයා සහ සංඝයා බලා සිටියදී අහසින් බැස රජතුමාගේ දෝතට" වැඩි බව සඳහන් වේ. බෞද්ධ සම්ප්‍රදාය මත සැකසුනු මෙරට පාලන තන්ත්‍රයෙහි දිගුකාලීනව පැවැතීමට නම් අනිවාර්යෙන්ම බෞද්ධයෙකු වී, බෞද්ධාගම නගා සිටුවීමට ක්‍රියා කිරීමත් අවශ්‍ය විය. මෙම සත්‍යක්‍රියාවේ බලයෙන් රජුට නොමඳ ආශිර්වාදයක් මනාව ලැබුණු බව පෙනේ. අභිනවයෙන් ඉදි කළ මැඳුරේ දළදාව තැන්පත් කර දින 07 ක් පූජෝත්සව පවත්වා පරාක්‍රමබාහු නම් පිරිවෙණක් ද පූජා කර තිබේ.

අගනගරයට පූජනීය වස්තූන් වැඩම කළ ද, ඒ වන විට සසුනේ කටයුතු පසුගාමීත්වයට පත්ව තිබුණි. දුශ්ශීල භික්ෂූන් වහන්සේලාගේ ක්‍රියාකාරිත්වය බහුල වූහ. එය අවබෝධ කර ගත් රජු නව ක්‍රියා මාර්ග කිහිපයක් අනුගමනය කළේය . උගත් ශිල්වත් භික්ෂූන් වහන්සේලා දිවයිනේ නොසිටි බැවින් දකුණු ඉන්දියාව, මලය අර්ද්වීපය, සහ තම්බරට්ය ආදි

14. සුරවීර ඒ.වී. සංස්. පූජාවලිය, ඇම්.ඩි.ගුණසේන සහ සමාගම,කොළඹ 1961 පිටු. 26 - 28.

ප්‍රදේශ වලින් තෙරුන් වහන්සේලා වැඩම කරවා ගත්තේය. කාලයාගේ ඇවෑමෙන් පොතපත ලියන ආගමධර තෙරවරුන්ගේ පැවති හිගය වළකාලීමට ඉන්දියාවේ ධර්මග්‍රන්ථ මෙහි සුලභ කරවන ලදී. උගත් තෙරවරුන්ට පොත පත ලිවීමට අවශ්‍ය පහසුකම් සලසා දී ඇත.

බුදු දහමේ අභිවෘද්ධිය ඇති කිරිමේ අරමුණින් ක්‍රියා කළ රජු ශාසනික කටයුතු වල භාරකාරත්වය ස්වකීය මළණුවන් වූ භුවනෙකබාහු යුව රජුට පවරා ඇත. මෙම කුමරු ත්‍රිපිටක බුද්ධ දේශනාවෙහි විශාරදයෙකු බවට පත්කොට ඔහු ලවා භික්ෂූන්ට බණ කියවා බණ ඇසූ තෙරවරුන් මැද ස්ථවිර සම්මුතිය ලබා දී ඇත. සංඝ විනය අනාදිමත් කාලයක් පවත්වා ගැනීමේ අරමුණින් ක්‍රි.ව.1266 දී නැවත කතිකාවතක් සිදු කළ අතර එය ''දඹදෙණි කතිකාවත'' ලෙස හඳුන්වයි. දිඹුලාගල ආරණ්‍යක නිකායේ මේධංකර හිමියන්ගේ ප්‍රධානත්වයෙන් කතිකාවත පවත්වා තිබේ. දුශ්ශීල භික්ෂූන් සසුනෙන් නෙරපා, සංඝයා විසින් අනුගමනය කළ යුතු නීති රීති පද්ධතියක් පනවන ලදී. එකම යුගයක කතිකාවත් දෙකක් කිරිම තුළින් අවබෝධ වන්නේ සසුනේ පරිහානිය විශාල වශයෙන් සිදු වී පැවති බවයි. තවද දඹදෙණි පුරයෙන් පිටත සිරිවර්ධන පුර, බෙලිගල, කුරුණෑගල, කැලණිය, අත්තනගල්ල, බෙන්තොට, දෙවුන්දර සහ ශ්‍රී පාදයේ අලංකාර වෙහෙර විහාර කරවා සස සතු කර පූජා කර තිබේ. මෙමගින් සුවිශාල ශාසනික උන්නතියක් ඇති වූ බව පෙනේ.

රට තුළ බිහි වූ වියතුන් උසස් කෘති සම්පාදනයට දායක විය. එය එක් අතකින් බුදු සසුනේ උන්නතියට ද බෙහෙවින් බලපෑවේය. අප ඉහතින් සදහන් කළ පරිදි අරණ්‍යක මේධංකර හිමියන් දෙවෙනි පරාක්‍රමබාහු විසින් කරන ලද කථිකාවතෙහි ප්‍රමුඛව ක්‍රියා කළේය. උන්වහන්සේ විසින් විනයාර්ථ සමුච්චය, ජින චරිතය සහ පයෝග සිද්ධි යන කෘති රචනා කරනු ලැබිය. අත්තනගලු විහාරයේ වැඩ විසු අනවමදර්ශී මාහිමි දෛවඥ කාමධේනු, සිදත් සඟරාව හා පරෝපකාරය යන ග්‍රන්ථ රචනා කිරිමෙන් සුවිශාල ඥාන සම්භාරයක් එවකට සමාජයට ලබා දී තිබේ. විදේහ හිමියන් විසින් සමන්තකූට වර්ණනාව, රසවාහිනිය යන කෘතින් ද මයුරපාද බුද්ධපුත්‍ර හිමියන් විසින් පූජාවලිය, යෝගාර්ණවය හා ප්‍රයෝග රත්නාවලිය රචනා කිරීමට දායක විය. මිනිසුන්ගේ ජිවිතයට අගනා උපදෙස් ලබාදෙන සද්ධර්මරත්නාවලිය ධර්මසේන හිමියන් විසින් රචනා කරනු ලැබූවකි. "කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත" යන විරුදාවලියෙන් පිදුම් ලැබූ දෙවන පරාක්‍රමබාහු රජතුමා ද වනවිනිස මහ සන්නය, විසුද්ධි මාර්ග මහ සන්නය හා කව්සිළුමිණ මහා කාව්‍ය රචනා කර තිබේ. ආගම චක්‍රවර්තී හෙවත් විද්‍යාචක්‍රවරිතී විසින් බුත්සරණ, දහම්සරණ යනාදි කෘති මඟින් බුදුසරණ බුදුදහමේ ප්‍රබෝධය වඩාත් ස්මතුකර දැක්විමට සමත් විය.

දෙවන පරාක්‍රමබාහු රජතුමා වයෝවෘද්ධ භාවයට පත්විමෙන් පසු පෙර සිදුකළ පරිදි මහාසංඝයා ඉදිරියේ දී දළදාව හා පාත්‍රා ධාතුව ද මහාසංඝයා සහ ලක් රාජ්‍ය රැක බලා ගන්නා

ලෙස වැඩිමහලු පුත් බෝසත් විජයබාහුට පවරා දෙන ලදි. බෝසත් විජයබාහු රාජ්‍ය සමයේ දී පිය රජු විසින් ආරම්භ කරන ලද විහාරාරාම ඉදිකිරීම් තව දුරටත් ඉදිරියට පවත්වාගෙන යමින් අභිනව ගොඩනැගිලි ද නිමවා තිබේ. වාකිරිගල, ශ්‍රී පාදය, ගම්පල නියම්ගම්පාය විහාරය, වල්ගම්පාය විහාරය, යනාදි විහාරස්ථාන පිළිසකර කර අභයරාජ පිරිවෙණ සහ බුවනෙකබා පිරිවෙණ අ ලුතින් ඉදිකර ඇත.

ක්‍රි.ව.1270 බලයට පත් හතරවන විජයබාහු රාජ්‍ය සමයේදී චන්ද්‍රබානු නම් ජාවක රජු දළදාව හා පාත්‍රා ධාතුව ලබාගැනිමේ අරමුණින් ලංකාව ආක්‍රමණය කළත් එය පරාජය කිරිමට රජුට හැකිවිය. රජ පැමිණ දෙවසරකට පසුව රජුගේ මිත්ත නම් සෙනවියකුගේ දාසයකුව අල්ලස් දී රජු මැරවීය[15]. රජුගේ මලණුවන් වූ බුවනෙකබාහු තමාටත් මේ ඉරණම අත්වේ යැයි බියෙන් යාපහුවට පලා ගියේය. රජු බුදුදහමේ චිරජීවනය ඇති කිරීමේ අරමුණින් ධර්ම පුස්තක ලියවා විහාරස්ථාන වලට බෙදා හැරියේය. යාපහුව පර්වතයේ දී අලංකාර දළදා මැදුරක් ඉදිකර දළදා වහන්සේ එහි තැන්පත් කරන ලදී. මේ සමයේ විශාල සේනාවක් සමග දිවයිනට පැමිණි ආර්ය චක්‍රවර්තී යාපහුව ආක්‍රමණය කර දළදාව පැහැරගෙන ගොස් පඩිරට කුලසේකර රජුට දුන්නේය. දළදාව රැගෙන යාම තුළින් මෙරට ආගමට දැඩි පහරක් එල්ල විය. එය එක් අතකින් ශාසනික පරිහානිය දැඩිව පෙන්නුම් කිරිමකි. පසුව බලයට පැමිණි තුන්වන පරාක්‍රමබාහු (ක්‍රි.ව.1287-1239) නැවත දළදාව පඬි රජුගෙන් ලබාගෙන සාමකාමි පාලනයක් ගෙන ගියේය. දළදාව නැවත ලබාගැනිමට හැකි විමට හැකිවීම ශාසනික ඉතිහාසයෙ හි සුවිශේෂි කඩඉමකි.

යාපහුව රාජධානියට සාපේක්ෂව බුදුදහමේ වඩාත් පිබිදිමක් ඇති වූ කාලපරිච්ඡේදයක් වන්නේ කුරුණෑගල සමයේදීය. ඒ වන විට පිරිහෙමින් පැවති බුද්ධ ශාසනය නගා සිටුවීමේ කාර්ය හතරවන පරාක්‍රමබාහු (ක්‍රි.ව.1302-1326) වෙත පැවරිණ. එතුමා යාපහුවේ වැඩ සිටි දළදා වහන්සේ කුරුණෑගලට වැඩම කර තුන් මහල් අලංකාර දළදා මැදුරක් ඉදිකිරිමට පියවර ගත්තේය. විසිතුරු ලෙස ඉදිකළ මෙම මැදුරෙහි දළදාව සහ පාත්‍රා ධාතුව තැන්පත් කිරිමට පියවර ගන්නා ලදී. රජතුමා දළදා පුද පූජා සඳහා නියෝගයක් සකස් කොට පූජෝත්සව ද පැවැත්විමට විධිවිධාන සැලැස් විය[16]. "දළදා සිරිත" නම් ග්‍රන්ථයක් ද පූජා සිරිත් ඇතුලත් කොට සිංහල භාෂාවෙන් සකස් කළේය. එම කෘතියට අනුව වසරක් පාසාම දළදා පෙරහැරක් පවත්වා තිබේ. මෙම රජු විසින් ඉටු කළ සුවිශේෂි කාර්ය වන්නේ සොළී රටින් වැඩම වූ මහතෙර නමකගේ සහයෝගයෙන් ජාතක කථා ඉගෙන ගෙන ඒවා සිංහලයට නගා පන්සිය පනස් ජාතක පොත ලියවා ලක්දිව සෑම තැනම ප්‍රචාරය කොට හැරියේය. මීට අමතරව දිවයින පුරා වෙහෙර විහාර ඉදිකරන ලද්දේය. තොටගමු විහාරයෙහි දෙමහල් ප්‍රාසාදයක් සහ අගනා පොල් උයනක් පූජා කර තිබේ. මෙම රජතුමා විසින් සතර කෝරළේ අලුත් නුවර උපුල්වන් දේවාලයක් ද තැනවීය. ස්වකීය රාජ්‍ය කාලය තුළ පිරිවෙණ අධ්‍යාපන දියුණු කරලීමට

15. විශ්ව විද්‍යාල ලංකා ඉතිහාසය II, එම, පිටු, 581 - 601.
16. ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය III, එම, පිටු,129.

බෙහෙවින් උනන්දු වූ බව පෙනේ. ප්‍රධාන වශයෙන් තොටගමු විජයබා පිරිවෙණ, දෙවුන්දර නන්දන පිරිවෙණ, වැලිගම අග්‍රබෝධි පිරිවෙණ, ශ්‍රී පරාක්‍රමබාහු පිරිවෙණ හා විදාගම ශ්‍රී ඝාණානන්ද යන පිරිවෙණ ආරම්භ කිරීමත් සමග ගිහි පැවිදි අධ්‍යාපනය වඩාත් දියුණු තලයකට පැමිණියේය. එය එක් අතකින් බුදු සසුනේ උන්නතියට ද සෘජු ලෙස ඉවහල් විය.

පණ්ඩිත පරාක්‍රමබාහු රාජ්‍යය සමය කෙබඳු ලෙසින් අවසාන වූයේ දැයි ප්‍රධාන වංශ කථාවලින් අනාවරණය නොවූන ද මැදවල සන්නසේ එන පුරාවෘතයකට බෝදා මා පාණන් විසින් ගැසූ කැරැල්ලකින් රජුට හදි කළ බවට ද ඉන්පසු භික්ෂූන් අගනුවර හැර පලා ගොස් ඇත[17]. ඉන් අනතුරුව වන්නි බුවනෙකබාහු සහ සවුළු විජයබාහු යන රජවරුන් දෙදෙනකු ගැන තොරතුරු ලැබෙන අතර, කුරුණෑගල මුල් කරගෙන පාලනය කරන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. මෙම පසුබිමක් තුළ සිව්වන බුවනෙකබාහු ක්‍රි.ව.1341 ගම්පල කේන්ද්‍රගතව අභිනව රාජධානියක් ආරම්භ කරනු ලැබේ. වැඩිකල් නොයවාම සංඝ සමාජය විවිධ බලවේගයන් මගින් දූෂණය වන්නට පටන් ගත්තේය.

දඹදෙණි රාජ්‍ය පෙළපත අවසන් වීමත් ඉන්පසු දේශපාලන අර්බුද ඇතිවීමත් නිසා, දුශ්ශීල වංචනිකයන්ට ශාසනයට පැමිණ විනාශ කිරීමට හැකියාව ක්‍රමිකව උදා වුණේය. මෙවන් පසු බිමක් තුළ ශාසනයෙහි පුනර්ජීවනයත් ඇති වීමට පසුබිම සැකසෙන්නේ ගම්පළ යුගය කේන්ද්‍රකරගෙනයි. ශාසනික පිබිදීම ඇතිකර වීම සඳහා හතරවන බුවනෙකබාහු රාජ්‍ය සමයේ විසූ "මෙහෙනවර වංශාභිජාත සේනාධිලංකාර සෙනෙවිරත්" අයගේ මෙහෙවර ඉතා වැදගත් විය. ශාසනික උන්නතිය ඇති කිරීමට නම් භික්ෂූන් වහන්සේලා අතර යම් සමගියක් ඇති කළ යුතුය. මෙය වටහාගත් ඇමතිතුමා අමරගිරිවාසී වනරතන මාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් ග්‍රාමවාසී හා ආරඤ්ඤවාසි යන නිකාය දෙකේම භික්ෂූන් රැස් කරවා, කරුණු විමර්ෂණය කර දුශ්ශීල භික්ෂූන් වහන්සේලා නෙරපා දැමීමටය පියවර ගත්තේය. මෙම සම්මේලනය හතරවන බුවනෙකබාහු රජුගේ හතරවන රාජ්‍ය වර්ෂයේ දී පැවැත්වූ බව නිකාය සංග්‍රහයේ සඳහන් වේ. පොළොන්නරු යුගයේ සිටම ශාසනනායක ධූරයට ප්‍රධාන භික්ෂූන් වහන්සේ නමක් පත් කළේය. මෙම භික්ෂුව සංඝ සමාජයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන ලදී. ගම්පොළ යුගය වන විට මෙම තනතුර "සංඝරාජ" යන නමින් හැඳින්විය.

ගම්පොළ යුගයේ වර්ධනය වූ ශාසනික පිබිදීමේ ප්‍රධාන භූමිකාව සීලවංශ ධම්මකිත්ති හිමියන් විසින් ඉටු කළේය. දකුණු ඉන්දියාවේ ආන්ද්‍ර ප්‍රදේශයේ වාසය කරමින් ලබාගත් අත්දැකීම් සහ ඉන්දියානු වාස්තු විද්‍යාඥයින් පිරිසක් සමග මෙරට පැමිණ සුවිශාල වෙහෙර විහාර ඉදිකිරීම් සඳහා දායක වූහ[18]. මෙම හිමියන් විසින් කැඳවාගෙන ආ ගණේෂ්වරාචාර්ය යන ශිල්පියා සේනාධිලංකාර ඇමතිතුමාගේ මෙහෙය වීම යටතේ ගඩලාදෙණිය සද්ධර්මතිලක රජමහා විහාරය ඉදිකර තිබේ. බෞද්ධාගමට හින්දු ආගම ඉතා කිට්ටුවෙන් පැවති අවධියකදී මෙම විහාරය ගොඩ නගා තිබේ. මෙම විහාර කර්මාන්ත ඉදිකිරීමට සමගාමීව පන්හන්ගල

17. **Ex vol. III**. P. 471 – 472..

18. රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානිය, පිටු.

හෙවත් ලංකාතිලක විහාරය සේනාධිලංකාර සෙනෙවිතුමාගේ පුරෝගාමීත්වයෙන් ස්ථාපතිරායර් නැමැත්තා විසින් ඉදිකර ඇත. මෙම ගොඩනැගිල්ල හින්දු ආභාසය මත ඉදිවූවකි. මහාචාර්ය සෙනරත් පරණවිතාරන පවසන්නේ ලංකාතිලක විහාරය ද්‍රවිඩ, ඉන්දු සහ චීන අංග මිශ්‍රව පොළොන්නරු ගෘහ නිර්මාණ ශිල්පයම නිමවූවක් බවයි[19]. ගම්පොළ කේන්ද්‍රගතව මෙවැනි විහාරාරාම ඉදිවීම බුදු සසුනේ පිබිදීමට බෙහෙවින් ඉවහල් විය.

සිව්වන බුවනෙකබාහු රාජ්‍යය සමයේ ශාසනික පිබිදීම ඇති කිරීම සඳහා සේනාලංකාධිකාර විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග එතරම් කාලයක් පැවතුනේ නැත. මුල් වකවානුවේ සිදු වූ පරිද්දෙන් රාජ්‍යය අභ්‍යන්තරයේ හටගත් සිවිල් අර්බුද හේතු කොටගෙන භික්ෂූන් වහන්සේලා අතර විනය පිරිහී ගියේය. ඇති වූ අර්බුද සමතයකට පත් කරමින් තුන්වන වික්‍රමබාහු (ක්‍රි.ව.1366 - 1372) බලයට පත් වූ අතර අගමැති පදවිය ඉසුලූ නිශ්ශංක අලහක්කෝනාර ශාසනික කටයුතු වල පුරෝගාමීව නියැළී සිටියේය[20]. මොහු නටබුන්ව පැවති කැලණියි වැනි විහාරස්ථාන පිලිසකර කිරීම සඳහා පුරෝගාමී වී ඇත. ඒවගේම මොහුගේ මිත්‍රයක වන භාස්කර ජයමහලේ සිටාණ නම් මන්ත්‍රීවරයකු නියම්ගම්පාය පිරිවෙණ ඉදිකර සිද්ධාර්ථ නම් ස්ථවිරයන්ට පූජා කිරීම[21] මෙම අවධියේ සිදු වූ වැදගත් ශාසනික මෙහෙවරකි.

බාහිර උවදුරුවලට ලක්වෙමින් පැවති බුදු සසුනේ යලි ප්‍රබෝධයක් ඇති වන්නේ වීරබාහු බලයට පත්වීමත් සමගය. නිකාය සංග්‍රහයට අනුව මෙතුමා සසුනේ චිරජීවනයට නොයෙක් සේවාවන් සිදු කර ස්වකීය පුත්‍රයකු ද සසුන් ගත කළ බවට අනාවරණය වේ. ක්‍රිඃවඃ1396 දී පමණ වීරබාහුගේ අනුග්‍රහය යටතේ ශාසනික සංශෝධනයක් සිදුවන අතර ඒ සඳහා දෙවෙනි ධම්මකිත්ති හිමියන්ගේ නායකත්වය ලැබුණු බවට සඳහන් වේ. මෙයාකාරයෙන් ඉතා කෙටි කාලයක් තුළ දී සංඝ ශෝධනයක් ඇතිවීමෙන් පැහැදිලි වන්නේ මෙකල බෞද්ධ ශාසනය පිරිහෙමින් පැවති බවත්, එම පිරිහීම වළක්වා ගැනීම සඳහා ඇතැම් භික්ෂු කොටස් කැපවීමකින් කටයුතු කරන ලදී. විශේෂයෙන්ම සීලවංශ ධර්මකීර්ති හිමියන් පාරමී ශතකය, ජනානුරාග චරිතය සහ සුවිසි විවරණය ද දේවරක්ඛිත ජයබාහු මාහිමි නිකාය සංග්‍රහය, සද්ධර්මාලංකාරය, බලවතාර සන්නස සහ ජිනබෝධාවලී යන කෘති රචනා කිරීම බෞද්ධාගමේ පිබිදීමට මහත් රුකුලක් විය. මෙරට සන්දේශ කාව්‍ය ඉතිහාසයේ ප්‍රථම කෘතිය ලෙස මයුර සන්දේශය ගුරුළුගොමින්ගේ මුනුබුරකු වශයෙන් හඳුනාගන්නා කවීශ්වර පඩිතුමා විසින් රචිත බවට විශ්වාස කරනු ලැබේ. කතෘන් නිවැරදිවම හඳුනානොගත් ග්‍රන්ථ කිහිපයක් ගම්පල යුගයේ දී රචනා විය. ඒ අතර එළුඅත්තනගලු වංශය, තිසර සන්දේශ කාව්‍යය, සද්ධර්මාමෘත මංජුසාව සහ වුත්තමාලා ශතකය ද ඒ අතර වැදගත් වේ. මෙවැනි කෘති බිහිවීමට එකල පැවති හිතකර පසුබිම වඩාත් යෝග්‍ය විය. බොහොමයක් කෘති මගින් ආගමික ප්‍රබෝධය ඉස්මතුවන බැවින් සසුනේ වර්ධනයක් ද පෙන්නුම් කළේය. බුදුදහමට සමගාමීව දෙවියන් ඇදහීම ප්‍රචලිත සසුනේ පසුගාමීත්වයට ද හේතු විය.

---

19. එම,පිටු 88.

20. රෝහනදීර, මැන්දිස්,බුදු සමය නිරිතදිග, තරංග ගී ප්‍රින්ටර්ස්, මහරගම, 2001 , පිටු 42.

21. එම.පිටු. 43.